වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2024

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 311

5 වන මහල, 1 වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල
දු.අ.-0112872054/0112887164
ෆැක්ස්- 0112872061/0112872048
ඊ මේල්-**info@nppd.gov.lk**

නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය

අන්තර්ගතය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 2

02.පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7

03 පරිච්ඡේදය- 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය.... 17

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක... 23

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 35

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 36

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව.. 26

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ 1947 වර්ෂයේදී නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ඉන් අනතුරුව ආංශික සංවර්ධනයත් ප්‍රාදේශිය සංවර්ධනයත් අත්වැල් බැඳගත් තිරසර සංවර්ධන ක්‍රියාවලියක අවශ්‍යතාවය මතුවූ බැවින්, ඊට පිළියමක් ලෙස ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්මක් සකස් කිරීම අරමුණු කරගෙන 2000 අංක 49 දරණ නගර හා ග්‍රාම නිර්මාණ සංශෝධිත පනතින් 2000 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව බවට ප්‍රතිව්‍යුහගත කරන ලදී.

ඒ අනුව ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්ම සැකසීමෙන් අනතුරුව ඊට අනුගත වන ලෙස ශ්‍රී ලංකාවේ පළාත් නවය සඳහා වෙන වෙනම ඒ ඒ පළාතේ ගැටළු හඳුනා ගනිමින් ද පවතින සම්පත් උපරිමව උපයෝගී කරගනිමින් ද තිරසාර සංවර්ධනයක් උදෙසා මාර්ගෝපදේශයක් ලබා දීමට කලාපීය භෞතික සැලසුම් සකස් කිරීම සිදු කෙරේ.

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක විසි පහ ආවරණය කරමින් පළාත් පාලන ආයතනවල සහයෝගය ඇතිව සීමිත ස්වභාවික සම්පත් ඵලදායී ලෙස භාවිත කරමින් ද, ස්වාභාවික පරිසරය රැක ගනිමින් ද ස්වාභාවික විපත් අවම වන සුදුසු ස්ථානයන්හි අපරව්‍යුහ පහසුකම්වලින් යුතු නගර හා සේවා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා නගර සැලසුම් කිරීම, ශ්‍රී ලංකාවට යෝග්‍ය නව නාගරික නිර්ණායකයන් හඳුනා ගැනීම, ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලි ලෙස උපයෝගී කර ගනිමින් ලංකාවට ගැලපෙන කර්මාන්ත උද්‍යාන ආකෘතියක් හඳුනා ගැනීම මගින් තිරසාර සංවර්ධනයට දායක වීම සිදු කරයි.

ඊට අමතරව ලංකාවේ ප්‍රධාන පූජාභූමිවල විධිමත් සංවර්ධනය උදෙසා වින්‍යාස සැලසුම් සැකසීමත්, ඊට අනුරූපීව ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, එම ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර දීමත් සිදු කරමින් ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික පුනරුදය සඳහා ද විශාල දායකත්වයක් ලබා දේ.

ඉහත සඳහන් කර්තව්‍යයන් ඉටු කරමින් ශ්‍රී ලංකාවේ සැලසුම්කරණයේ යෙදී සිටින ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඉටු කළ සහ ඉටුකරමින් සිටින මෙහෙවර අතිමහත්ය.

මෙම කර්තව්‍යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ වන කලාපීය භෞතික සැලසුම් අංශය, ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය, පර්යේෂණ අංශය හා එම මෙහෙය සඳහා දායකත්වය සපයන පාලන අංශය, ගිණුම් අංශය, ඉංජිනේරු අංශය, වාස්තු විද්‍යාත්මක අංශය යන අංශ සාමූහිකව කැප වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"සුසැදි සුරැකි සොඳුරු බිමක නියමු"

මෙහෙවර

1. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් සකස්කිරීම
2. ශ්‍රී ලංකාවේ ඉඩම්වල ආර්ථික, සාමාජීය, භෞතික සහ පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලසුම් කිරීම ප්‍රවර්ධනය සහ නියාමනය අරමුණු කරගෙන ජාතික භෞතික සැලැස්මක් සකස් කිරීම
3. කලාපීය සහ ප්‍රාදේශීය භෞතික සැලසුම් මගින් එම ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ ජාතික භෞතික සැලැස්ම ක්‍රියාවට නැංවීම
4. කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික සැලසුම් බලධරයන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික සැලසුම් නියමු උපදෙස් සකස් කිරීම.
5. ස්වාභාවික පහසුකම් අරක්ෂා කිරීම, ස්වාභාවික පරිසරය, ගෘහ නිර්මාණමය සහ ඓතිහාසික වශයෙන් වැදගත් ගොඩනැගිලි සහ ස්වාභාවික ලෙස විසිතුරු ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම

අරමුණු

1. ශ්‍රී ලංකාවේ සැලසුම්ගත තිරසාර හා සොඳුරු භෞතික සංවර්ධනයක් අරමුණු කරගෙන, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම නිර්මාණය කිරීම.
2. ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සමාජයීය, භෞතික හා පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලසුම්කරණයක යෙදීම.
3. භෞතික සංවර්ධනයන් සැලසුම් කිරීම සඳහා ඕනෑම ආයතනයකට හෝ සංවිධානයකට අවශ්‍ය සහයෝගය ලබාදීම.
4. විශ්වාසනීය හා ඵලදායී සේවාවක් ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ ධාරිතාවය සංවර්ධනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

i. ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියක් සකස් කිරීම
ii. ජාතික භෞතික සැලැස්මක් පිළියෙල කිරීම
iii. කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික නිර්මාණ බලධරයන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික නිර්මාණ නියමු උපදෙස් සකස් කිරීම.

iv. කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික නිර්මාණ බලධරයාට යම් කලාපීය හෝ ප්‍රාදේශීය සැලැස්මක් පිළියෙල කිරීමට නොහැකි වූ අවස්ථාවක හෝ එවැනි සැලැස්මක් පිළියෙල කරන ලෙස ඒ බලධරයා විසින් ඉල්ලා සිටි විට එවැනි යම් කලාපීය හෝ ප්‍රාදේශීය සැලැස්මක් පිළියෙල කිරීම.

v. කලාපීය භෞතික සැලසුම් පිළියෙල කිරීමේ දී සහ සංවර්ධනය කිරීමේ දී පළාත් සභාවලට සහාය වීම.

vi. ජාතික භෞතික නිර්මාණ සභාව වෙත ඉදිරිපත් කිරීම පිණිස, ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියට අනුකූලව අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

vii. ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තිය, ජාතික භෞතික සැලැස්ම සහ ක්‍රියාත්මකව පවතිමින් තිබෙන ජාතික භෞතික සැලසුම් ක්‍රමෝපාය වරින් වර සමාලෝචනය කිරීම සහ පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වූ අවස්ථාවක, ඒ ප්‍රතිපත්තියක්, සැලැස්මේ ක්‍රමෝපාය වල වෙනස්කම් සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ කිරීම.

viii. ජාතික භෞතික නිර්මාණ සභාව විසින් අනුමැතිය දී ඇති ජාතික භෞතික සැලැස්ම ක්‍රියාත්මක වීම නියාමනය කිරීම.

ix. ජාතික භෞතික නිර්මාණ සභාව සහ අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව විසින්, ඉටුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ලේකම් කාර්යාලයක කර්තව්‍ය ඉටු කිරීම ද ඇතුලුව, සභාවේ සහ සම්බන්ධීකරණ කමිටුවේ සියලු ක්‍රියාකාරකම්වලදී සභාවට සහ සම්බන්ධීකරණ කමිටුවට සහාය වීම.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
සංවිධාන සටහන



1.4 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පහත සඳහන් ප්‍රධාන අංශවලින් සමන්විතය.

1. කලාපීය භෞතික සැලසුම් අංශය
2. ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය
3. පර්යේෂණ අංශය
4. සම්බන්ධීකරණ හා නියාමන අංශය
5. වාස්තු විද්‍යා අංශය
6. ඉංජිනේරු අංශය
7. පාලන අංශය
8. ගිණුම් අංශය
9. අභ්‍යන්තර විගණන අංශය

1.5 2024 වසරේදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශය මගින් ලැබුණි

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2024 වසරේදී පහත සදහන් කටයුතු සාර්ථකව නිම කරන ලදි.

1.ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනතට අනුකූලව සකස්කරන ලද ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම 2019-2050 2019 ජූනි 23 දින ගැසට් මගින් ප්‍රකාශයට පත්කරන ලදි. ඉන්පසුව එය යාවත්කාලීන කර ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම 2048 ලෙස සකස් කර 2023 වසරේදී එවකට ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ජාතික භෞතික නිර්මාණ සභාවට ඉදිරිපත්කර සැලැස්මට අනුමැතිය ලබාගන්නා ලදී.

- ජාතික භෞතික නිර්මාණ සභාව විසින් දෙනු ලැබූ නිර්දේශ අනුව මහජන අදහස් ලබා ගැනීමට කටයුතු කරන ලදී.





- ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2048 එවකට ගරු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කල අවස්ථාවේදී සැලැස්ම සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කර ප්‍රාදේශීය නිළධාරීන් හා දේශපාලන අධිකාරිය දැනුවත් කරන ලෙස උපදෙස් දෙන ලදි.
- ඒ අනුව 2023 සහ 2024 වර්ෂ තුළ ලංකාවේ සියළුම දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කර අවසන් කර ඇත.

2. 2000 අංක 49 පනතින් සංශෝධිත 1946 අංක 13 දරන නගර සහ ග්‍රාම නිර්මාණ සැලසුම් ආඥාපනතේ 5(ඒ), (බී) සහ 5(සී) වගන්තියේ විධිවිධාන අනුව ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව අයත් වන විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රදේශ සඳහා කලාපීකරණ සැලසුම් සකස් කල යුතුය. ඒ අනුව 2024 වසරේදී නැගෙනහිර හා මධ්‍යම පළාත් සඳහා කලාපීකරණ සැලසුම් සකස් කරන ලදි. එහිදී, එක් එක් කලාපීකරණ සැලසුම් සඳහා 2024 වර්ෂයේ දී සිදු කරන ලද කටයුතු පහත සඳහන් වේ.

මධ්‍යම පළාත

මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම-2035, 11කොටස :Central Province Regional Physical Plan –2035,Volume II) සකස්කිරීමට අදාලව,

- ආංශික සංවර්ධන උපාය මාර්ග (Sectoral Development Strategies) සකස්කිරීම
- ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘති (Action Projects) හඳුනාගැනීම
- මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම - 11කොටස :Central Province Regional Physical Plan –2035,Volume II) වාර්තාව සකස්කිරීමේ කටයුතු සිදුකරමින් පැවතීම

නැගෙනහිර පළාත

- නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම - 11කොටස (Eastern Province Regional Physical Plan –2035,Volume II) වාර්තාව සකස්කිරීම

3. **ප්‍රාදේශීය සහා සීමාවන්හි පිහිටි නාගරික ප්‍රදේශ හඳුනා ගැනීම හා ප්‍රකාශයට පත් කිරීම**

ලෝකයේ විවිධ රටවල් විවිධ නිර්ණායක/දර්ශක භාවිතා කරමින් නාගරික ප්‍රදේශ හා ග්‍රාමීය ප්‍රදේශ වර්ගීකරණය කරනු ලබයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ ලෙස වර්ගීකරණය කිරීමේ දී නිර්ණායක/දර්ශක ලෙස හුදෙක්ම පරිපාලනමය ඒකක පමණක් භාවිතා කර ඇති අතර, නිල වශයෙන් මහා නගර සභා සහ නගර සභා බල ප්‍රදේශ පමණක් නාගරික ප්‍රදේශ ලෙස වර්ගීකරණය කර ඇත. එමනිසා ශ්‍රී ලංකාවේ නාගරීකරණයේ සැබෑ තත්ත්වය විදහා දැක්වීමට අසමත් වී ඇත. මෙම අවශ්‍යතාවය පිළිබඳව 1998 වර්ෂයේ දී පිහිටුවනු ලැබූ නිවාස හා නාගරික සංවර්ධනය පිළිබඳ වූ ජනාධිපති කාර්ය සාධක බලකාය මගින් ද නිර්දේශ කර තිබූ නමුත්, විධිමත් ලෙස ඒ සඳහා අධ්‍යයනයක් සිදු කර නොමැති නමුත්, විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් මේ පිළිබඳව විවිධ අධ්‍යයනයන් සිදු කර ඇත.

ශ්‍රී ලංකාවේ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ වර්ගීකරණය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් මේ වනවිට පවතින අතර, එම වර්ගීකරණය සිදු කිරීමෙන් නාගරික සංවර්ධනය විධිමත් කළ හැකි වන අතර, එහි දිශානතිය සැලසුම් කිරීමට හා පුරෝකථනය කිරීමට හැකි වනු ඇත. උක්ත කාරණය පෙරදැරි කරගෙන ප්‍රාදේශීය සහා සීමාවන්හි පිහිටි නාගරික ප්‍රදේශ හඳුනා ගැනීම හා ප්‍රකාශයට පත් කිරීම යන මැයෙන් අමප/21/2082/306/092 දරන අමාත්‍යය මණ්ඩල තීරණය ගෙන ඇත. ඒ අනුව අප දෙපාර්තමේන්තුව මගින් විවිධ ආයතන විසින් මෑතක දී මේ පිළිබඳව කර ඇති පර්යේෂණයන් ද අධ්‍යයනය කර නාගරික ප්‍රදේශ හා ග්‍රාමීය ප්‍රදේශ වර්ගීකරණය කිරීම සඳහා සුදුසු නිර්ණායකයන් හඳුනා ගනු ලබන අතර, එම නිර්ණායකයන්ට අනුමැතිය දීම උපදේශක සභාවක් මගින් සිදු කරනු ලැබේ.

එවකට නාගරික හා නිවාස සංවර්ධන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා වෙත විශ්ලේශන වාර්තාව සහ සිතියම් ඉදිරිපත් කල අවස්ථාවේදී මෙම අධ්‍යයන ප්‍රතිඵල සියළුම දිස්ත්‍රික්

සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කර අදහස් හා යෝජනා ලබා ගන්නා ලෙසට තීරණය විය.
ඒ අනුව 2024 වර්ෂය තුළ සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කර ලිඛිත අනුමැතිය ලබා ගන්නා ලදී.

4. අනුරාධපුර ඇතුළුනුවර පුරා විද්‍යා රක්ෂිත තුල පදිංචිකරුවන් එම ප්‍රදේශයෙන් ක්‍රමානුකූලව පුනස්ථාපනය කර ඇතුළුනුවර පුරාවිද්‍යා සංරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම මගින් ඇතුළුනුවර ප්‍රදේශයේ පුරාවිද්‍යා කැණීම් සිදුකිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගෙන අනුරාධපුර ලෝලුගස්වැව නව නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

එමෙන්ම මේ තුලින් අනුරාධපුරයේ සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීමෙ සහ ආර්ථික පුනර්ජීවනයක් ඇති කිරීම ඉලාපොරොත්තු වන අතර වඩා හොඳ ජීවන තත්ත්වයක් සහ නාගරික පහසුකම් සහතික කිරීම මගින් ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තියට (NIRP) අනුකූලව ඇතුළුනුවර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම අරමුණු කරන ලදී.

ඇතුළුනුවර ඉඩම් අත්පත්කර ගැනීමේ යෝජනාව පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉඩම් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට ප්‍රථම ඇතුළුනුවර සඳහා **"ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය"**ට (NIRP) අනුකූලව නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලෙස ඉඩම් අමාතයාංශය විසින් උපදෙස් ලබාදීම සිදු කල අතර එවකට අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති **"මහාපරිමාණ ව්‍යාපෘති ක්‍රමෝපායනය හා වේගවත් කිරීමේ"** කමිටුව විසින්ද නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලෙස දැනුම්දෙන ලදී.
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සතුව නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා විශේෂඥ දැනුමක් සහිත නිළධාරීන් නොමැති බැවින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාශයේ ලේකම්ගේ උපදෙස් පරිදි ඒ සඳහා තනිපුද්ගල උපදේශකයන් පත් කිරීම සඳහා අවශය ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.
එමෙන්ම නාගරික සංවර්ධන හා නිවාස අමාතයාංශයේ ලේකම් විසින් ලබාදුන් උපදෙස් පරිදි මේ සඳහා මුදල් අමාතයාංශයේ විශේෂ අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කටුයතු සිදුකරන ලදී .
ඒ අනුව **රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් තනි උපදේශකයින් 09 දෙනෙකු බඳවා ගැනීම සඳහා 2023.08.07 දින අනුමැතිය ලබාදෙන ලදී.**
පිරිවැය අවම කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් තමන් සතු වෘත්තිකයන් ද භාවිතා කරමින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා පහත සඳහන් තනි පුද්ගල උපදේශකයන් මාර්ගෝපදේශ වගන්ති 4 අනුව පත් කිරීමට පියවර ගන්නා ලදී.

- **ප්‍රජා සංවර්ධන විශේෂඥ (1)** — **දත්ත විශ්ලේෂණ විශේෂඥ (1)**
- **භූගෝලීය තොරතුරු පද්ධති විශේෂඥ (1)** — **නැවත පදිංචිකිරීමේ විශේෂඥ (1)**
- **ජීවනෝපාය සංවර්ධන විශේෂඥ (1)** — **සමාජ නිළධාරීන් (4)**

ඒ අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් මාර්ග සංවර්ධන අධිකාරිය, උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන, නාගරික සංවර්ධන අධිකාරිය, ඉඩම් අමාත්‍යාංශය **සහ නාගරික සංවර්ධන හා නිවාස** අමාත්‍යාංශය **යටතේ සාර්ථක ලෙස** නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරී සැලැසුම් **සකස් කර ඇති විශේෂඥයන්ගේ විස්තර ලබාගන්නා ලදී. එම ආයතනයන් විසින් ලබාදුන් විශේෂඥයන්ගෙන් තනි පුද්ගල උපදේශකයන් ලෙස** නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා **2023.08.11 දින යෝජනා (RFP) කැඳවීම සිදුකල අතර ඒ සඳහා**

ප්‍රමාණවත් යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2023.09.21 දින තනි පුද්ගල උපදේශකයන් සඳහා නැවත යෝජනා (RFP) කැඳවීම සිදු කරන ලදී.

එසේ ඉදිරිපත්වූ තනි පුද්ගල උපදේශකයන්ගේ තාක්ෂණික යෝජනා (Technical Proposal) ඇගයීමෙන් පසු තෝරාගත් උපදේශකයන්ගේ මූල්‍ය යෝජනා (Financial Proposal) සම්බන්ධ සම්මුඛ පරීක්ෂණය 2023.11.27 පවත්වන ලද අතර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සුදුසුකම් ලත් තනි පුද්ගල උපදේශක නාමලේඛණය අනුමත කරන ලදී.

එලෙස පත් කර ගත් තනි පුද්ගල උපදේශකයන්ගෙන් බහුතරය මාර්ග සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු නිලධාරීන් විය. මෙම නිළධාරීන් මාර්ග සංවර්ධන අදිකාරියේ එකගතාවය මත නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා ඉදිරිපත්වී තිබිණි. එසේ වුවද එම නිලධාරීන්ට තනි පුද්ගල උපදේශකයන් ලෙස කටයුතු කිරිමට අනුමැතිය ලබා නොහැකි බව මාර්ග සංවර්ධන අධිකාරිය අධයක්ෂ ජනරාල්ගේ අංක MUDH/ESDD/Gen හා 2024.07.02 දිනැති ලිපිය මගින් දැනුම් දෙන ලදී. එලෙස මාර්ග සංවර්ධන අධිකාරිය මගින් අනුමැතිය ලබා නොදුන් බැවින් එම කටයුත්ත අසාර්ථක විය. මේ සම්බන්ධව මුදල් අමාත්‍යංශය දැනුවත් කර නැවත පදිංචි කිරිමේ සැලැස්ම සකස් කිරිම සඳහා සුදුසු උපදේශක ආයතනයක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගෙන ඇත.

ඒ අනුව 2024.11.25 වන දින පුවත්පත් දැන්වීමක් පල කරන ලද අතර උපදේශක ආයතන 14 ක් ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇත. ඉන් සුදුසුකම් සපුරා ඇති උපදේශක ආයතන 07 ක් තොරා ගුන ලැබූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව ඔවුන්ගෙන් යෝජනා කැඳවීමට නියමිතය.

5.1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ 6(2)b හා 21(2) වගන්ති යටතේ **ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට ලැබී ඇති බලතල අනුව බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබෙන ඉල්ලීම ද සලකා බලමින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද නිර්ණායක සපුරනු ලබන ආගමික සිද්ධස්ථාන පමණක්** පූජාභූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබයි. ඒ අනුව 2024 වසරේදී ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද ආගමික ස්ථාන පහත සඳහන් වේ.

2024 වර්ෂයේ නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද ස්ථාන					
පළාත	**දිස්ත්‍රික්කය**		**ආගමික ස්ථානයේ නම**	**ගැසට් කරන ලද දිනය**	**අංකය**
දකුණ	හම්බන්තොට	01	උද්ධකන්දර ජමහා විහාරය	2024.02.07	2370/11
වයඹ	කුරුණෑගල	02	දඹදෙනිය රජමහා විහාරය	2024.02.07	2370/12
ඌව	මොනරාගල	03	කොටසර පියංගල රජමහා විහාරය	2024.02.20	2372/09
වයඹ	පුත්තලම	04	වෙහෙරගල රජමහා විහාරය	2024.04.18	2380/27
මධ්‍යම	නුවරඑළිය	05	බඹරකැලේ රජමහා විහාරය	2024.04.18	2380/27
බස්නාහිර	කොළඹ	06	බටපොත ශ්‍රී සුධර්ශනාරාම පුරාණ විහාරය	2024.05.07	2383/20
දකුණු	හම්බන්තොට	07	වාදුරුප්ප ථේරපුත්තාභය රජමහා විහාරය	2024.05.07	2383/20
සබරගමුව	කෑගල්ල	08	කඩිගමුව ශ්‍රී නාගවනාරාමය	2024.05.07	2383/20
මධ්‍යම	මාතලේ	09	ක්ෂේත්‍රාරාම රජමහා විහාරය	2024.05.10	2383/44
දකුණු	හම්බන්තොට	10	හේනේකඩුව රජමහා විහාරය	2024.05.21	2385/12
වයඹ	කුරුණෑගල	11	ගොන්නව ශ්‍රී විෂ්ණු දේවාලය	2024.05.21	2385/12

6.ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා 2024 වසරේදී වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කර දී ඇත.

නාගරික සංවර්ධන ප්‍රදේශ, රජයේ ආයතන, ආගමික ස්ථාන සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම - 2024 වර්ෂය		
ස්ථානයේ නම	ව්‍යාපෘතිය	වර්තමාන තත්ත්වය
මාම්පිට වලගම්බා පුරාණ ගල්ලෙන් විහාරය	අවාසගෙය සහ විශ්‍රාම ශාලාව ඉදිකිරිම	සැලසුම් සකස් කර භාරදී ඇත
බියගම සුදර්ශනාරාම විහාරය	බුද්ධ මන්දිරය ප්‍රතිසංස්කරණය කිරිම	සැලසුම් සකස් කර භාරදී ඇත
අම්මඩුව කුඩාකතරගම දේවාලය	බුද්ධ මන්දිරය ප්‍රතිසංස්කරණය කිරිම	සැලසුම් සකස් කර භාරදී ඇත
බුද්ධශ්‍රාවක ත්‍රිපිටක ධර්මපීඨය දඹදෙණිය	බුද්ධශ්‍රාවක ත්‍රිපිටක ධර්මපීඨය ඉදිකිරිම	සැලසුම් සකස් කර භාරදී ඇත
රත්නපුර සමන් දේවාලය	රථගාල නවීකරනය කිරිම	සැලසුම් සකස් කර භාරදී ඇත
කොටවෙහෙර රජමහා විහාරය	දේව මන්දිරය ඉදිකිරිම	සැලසුම් සකස් කර භාරදී ඇත
මිරිසවැටිය මහා විහාරය	සැදැහැවතුන් සඳහා පූජාභාණ්ඩ සකස් මේ ගොඩනැගිල්ල	සැලසුම් සකස් කරමින් පවති
	භූ දර්ශන කිරිම	**සැලසුම් සකස් කල යුතුව ඇත**
ඔලබොඩුව රජමහා විහාරය	ප්‍රධාන පිවිසුම් දොරටු සඳහා වාහල්කඩ ඉදිකිරිම	සැලසුම් සකස් කර භාරදී ඇත
	ධර්මශාලාව ඉදිකිරිම	**සැලසුම් සකස් කල යුතුව ඇත**
අනුරාධපුර ලෝවාමහාපාය විහාරය	පොහොය ගෙය ඉදිකිරිම	සැලසුම් සකස් කරමින් පවති
අභයවැව විහාරය	උද්‍යානයේ සැදැහැවත්න් සඳහා පහසුකම් සැපසීම	**සැලසුම් සකස් කල යුතුව ඇත**
දිඹුලාගල ආරණ්‍ය සේනාසනය	වැසිකිළි පද්ධතිය සකස් කිරිම	සැලසුම් සකස් කරමින් පවති
කච්චිවත්ත පරමානන්ද විහාරය	ධර්මශාලාව ඉදිකිරිම	**සැලසුම් සකස් කල යුතුව ඇත**
	ධාතුමන්දිරය	සැලසුම් සකස් කරමින් පවති

2. ඉදිරි ඉලක්ක

2025 වසරේ දී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට බලාපොරොත්තු වන කටයුතු.

1.මෙම වාර්තාවේ විශේෂ ජයග්‍රහණ යටතේ අංක 1 න් දක්වා ඇති පරිදි යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලැස්ම 2050 සඳහා

1.කැබිනට් අනුමැතිය ලබා ගැනීම
2.ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
3. ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම

4.අදාල පාර්ශවකරුවන් දැනුවත් කිරීම, 2025 වසර තුළදී සිදු කිරීමට බලාපොරොත්තු වේ.

2.සීඝ්‍රයෙන් අවිධිමත් ලෙස සංවර්ධනය වන ජනාවාස සැලකිල්ලට ගෙන විධිමත් සංවර්ධනයකට මාර්ගෝපදේශ ලබාදීම සඳහා නැගෙනහිර හා මධ්‍යම පළාත් දෙක සඳහා කලාපීය සැලසුම් සකස් කරමින් පවතින අතර 2025 වර්ෂයේදී

- මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම සකස්කිරීමට අදාලව පහත සඳහන් කාර්යයන් නිමකිරීමට නියමිතය. රැස්කරන ලද තොරතුරු විශ්ලේෂණය මගින් ආංශික සිතියම් සකස්කිරීම
- රැස්කරන ලද තොරතුරු විශ්ලේෂණය මගින් මධ්‍යම පළාත් අවකාශීය ව්‍යුහ සැලැස්ම- 2035 (Spatial Structure Plan-2035) සකස්කිරීම
- මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම -2035 (දළ සැලැස්ම) සකස්කිරීම සහ මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලසුම් කමිටුව, තාක්ෂණ උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කිරීම
- පනතේ විධිවිධාන පරිදි, අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය කමිටුව සහ ජාතික භෞතික නිර්මාණ සභාව යන කමිටු වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතියන් ලබාගැනීම
- මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම-2035, 11 කොටස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම

- නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම -2035 11කොටස (Eastern Province Regional Physical Plan –2035,Volume II) සකස් කිරීමට අදාලව පහත සඳහන් කාර්යයන් නිම කිරීමට නියමිතය.

-පනතේ විධිවිධාන පරිදි තාක්ෂණ උපදේශක කමිටුව, අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව සහ ජාතික භෞතික නිර්මාණ සභාව යන කමිටු වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතියන් ලබාගැනීම
-නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම-2035, 11 කොටස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම

3.ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2021-2048 සඳහා සැලසුම් මාර්ගෝපදේශ සකස් කිරීම ආරම්භ කර ඇත.

4.අනුරාධපුර, ඇතුල් නුවර පුරාවිද්‍යා සංරක්ෂිත ප්‍රදේශය තුළ පදිංචිකරුවන් ක්‍රමානුකූලව පුනස්ථාපනය කිරීම සඳහා ලෝලුගස්වැව නගර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, 2025 වර්ෂයේ දී එම ව්‍යාපෘතියේ ඇතුල්නුවර පදිංචිකරුවන් පුනස්ථාපනය කිරීම සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට බලාපොරොත්තු වේ.

5.2025 වසරේදී ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට යෝජිත පූජා භූමි

කුරුණෑගල	රිදීගම රම්බඩඇල්ල මොණරාගල රජමහා විහාරය
	වතුකන ශ්‍රී ශෛලගිරි රජමහා විහාරය
	ශ්‍රී බෝධිවංශාරාම විහාරය
	ගණේගොඩ මණ්ඩලාරාම පුරාණ විහාරය
	ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරය
	යක්ගිරිලෙන් රජමහා විහාරය
	නාගොල්ල රජමහා විහාරය
	රුස්වෙහෙර පුරාණ විහාරය
	කෝන්ගොඩ ශ්‍රී බෝධිරාජාරාම පුරාණ විහාරය
පුත්තලම	ඇතුබැදි කදුරුකොට්ටේ පුරාණ රජමහා විහාරය
	පුරාණ ළිහිණිගිරි රාජමහා විහාරය
	ශ්‍රී සන්දනම් පොකුණ
	මුල්ගිරිගල රජමහා විහාරය
	මුරුක්කුටුවන ගල්ලෙන් රජමහා විහාරය
	නන්දි මිත්‍ර නවවංගු විහාරය
	පෙත්තිගම රජමහා විහාරය මහකුඹුක්කන්වල
	සිරි දෙව්රම් වෙහෙර රජමහා විහාරය
ගාල්ල	කප්පින්න මහා විහාරය
	මාගල්ල කච්චිවත්ත පුරණ රජ මහා විහාරය (පරමානන්දදීපදුන්නාරාම) පුරාණ විහාරය
	වැලිපිටිමෝදර ශ්‍රී ථූපාරාම රජමහා විහාරය
	කුලීගොඩ පුරාණ වන වාසල රජමහා විහාරය
	ශ්‍රී සුමනාරාම පුරාණ විහාරය
	දොඩන්දූව ඓතිහාසික කුමාරමහා විහාරය
	ශ්‍රී ජයවර්ධනාරාම විහාරය
මාතර	ශ්‍රී රෝහණ උපෝසථාගාර මහා විහාරය
	පනන්වල ගනේගොඩ පුරාණ විහාරය
	දීසවාළුකාරාම රජ මහා විහාරය
	වැවුරුකන්නල රජ මහා විහාරය
	මහාමන්තින්න රජමහා විහාරය
	වෙළුවනාරාම මූලමහා විහාරය
	කොට්ටේගොඩ සුදර්ශන බිම්බ මහාවිහාරය
	ඇත්කඳ පුරාණ රජමහා විහාරය
	වෙහෙරගම්පිට රජමහා විහාරය
	ශ්‍රී සුමනාරාම පුරාණ විහාරය
	සබරලේ ශ්‍රී නිවාසාරාම පුරාණ විහාරය
	ගනේගොඩ පුරාණ රජමහා විහාරය
හම්බන්තොට	**රම්බා රජ මහා විහාරය**
	බූද්ධියාගම සීගල රජ මහා විහාරය
	ගල්ගොඩකන්ද මිණි කිරුළ රජ මහා විහාරය
	කොන්දගල රජ මහා විහාරය
කොළඹ	රත්මලාන පුෂ්පාරාමය
	සංඛපිටිය පුරාණ විහාරය
	කොරතොට රජමහා විහාරය
කළුතර	පාහියංගල රජ මහා විහාරය
	මදුරාවල බැල්ලපිටිය විද්‍යාසේකර පිරිවෙන
	වරකාගොඩ ගල්ලෙන් රජමහා විහාරය
	පැලැද ගල්කණු ගොඩැල්ලේ පුරාණ රජමහා විහාරය
	වීදිගොඩ මහ විහාරය

ගම්පහ	දඩගමුව සුමිත්ත ශ්‍රී සුන්දරාරාම විහාරය
	අස්ගිරිය පුරාණ රජමහා විහාරය
	හෙයියන්තුඩුව පුරාණ විහාරය
	ශ්‍රී ජයසුන්දරාරාම රජමහා විහාරය
	සමන බැද්ද රජමහා විහාරය
	කොස්ගම ලෙනවර රජමහා විහාරය
අම්පාර	ඓතිහාසික දීඝවාපිය පරිවාර චෛත්‍ය රාජමහා විහාරය
	මුවන්ගල රජමහා විහාරය
	පරණ චේතියාරාම පුරාණ විහාරය
ත්‍රිකුණාමලය	පත්මරාජ පබ්බත වන සෙනසුන
	සිරි ගජබා ගල්ලෙන් විහාරය
	විල්ගම්වෙහෙර රජමහා විහාරය
මන්නාරම	මාතොට රජමහා විහාරය
පොළොන්නරුව	බුදුරුවයාය රජ මහා විහාරය
	ඓතිහාසික පුරාණ හබරණ ටැම්පිට විහාරය
	සෝමාවතිය රජමහා විහාරය
	කන්දේගම ධනංජය රජමහා විහාරය
	දිඹුලාගල රුහුණුගම වෙහෙරගල පෝවනය
අනුරාධපුර	කොස්සෝකන්ද කසාගල පුරාණ රජමහා විහාරය
	කන්දේගම නාමළුව සිංහගිරි රජමහා විහාරය
	මහකනදරාව තපෝවනය(ගලේපන්සල)
	මකුලෑව ශ්‍රී සුදර්ශන පුරාණ විහාරය
	රුනෑකන්ද රජමහා විහාරය
	අවුකන රජමහා විහාරය
	ශ්‍රී ධාතුසේන රජමහා විහාරය
	කිණිහිරිකන්ද රජමහා විහාරය
මුලතිව්	ශ්‍රී උදුම්බරා රජමහා විහාරය
නුවරඑළිය	යතුරුගැහු ලියද්ද රජමහා විහාරය
	මලියදේව පුරාණ රජමහා විහාරය
	මාදන්වල රජමහා විහාරය
	හඟුරන්කෙත වැගම රජමහා විහාරය
මාතලේ	ශ්‍රී රජමහ කොහොන් විහාරය
	ඓතිහාසික සොනුත්තර රජමහා විහාරය
මහනුවර	ඓතිහාසික සගම රජමහා විහාරය
රත්නපුරය	ගොඩකවෙල ශ්‍රී මහින්ද මහා විහාරය
	මානියම්ගම රජමහා විහාරය
	අම්මඩුව කුඩා කතරගමදේවාලය
කෑගල්ල	ශ්‍රී අරහත්ත මලියදේව රජමහා විහාරය

6.2025 වසරේදී සංවර්ධන සැලසුම් සකස් කිරීමට බලාපොරොත්තු වන පූජාභූමි

1. කොටසර පියංගල රජමහා විහාරය
2. කබලෑව ඇඹව ශ්‍රී සුධර්මාරාමය

8. පූජා භූමි සංවර්ධන ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යා සැලසුම්, ඉංජිනේරු සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම.

නාගරික සංවර්ධන ප්‍රදේශ, රජයේ ආයතන, ආගමික ස්ථාන සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම	
ස්ථානයේ නම	ව්‍යාපෘතිය
ඔලබොඩුව රජමහා විහාරය	ධර්මශාලාව හා පොදු ගොඩනැගිල්ල ඉදිකිරීම
අනුරාධපුර රන්මසු උයන	භූ දර්ශන කිරීම
අනුරාධපුර ලෝවාමහාපාය විහාරය	පොහොය ගෙය ඉදිකිරීම
සේරුවිල රජමහා විහාරය	දාන පිළියෙල කිරීමේ ශාලාව

10. මීට අමතරව වෙනත් ආයතන සහ පූජනීය ස්ථානවලින් කෙරෙන ඉල්ලීම් අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කර දීමට බලාපොරොත්තු වේ.

ඩබ්.ටී.එච්.රුවිර විතාන
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

ඩබ්.ටී.එච්. රුවිර විතාන
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
5 වන මහල, 1 අදියර, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

03 පරිච්ඡේදය- 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන 2024 රු.	2023 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	9,128,429	8,221,711
අග්‍රිම ලැබීම්	182,029,000	170,562,000
අත්තිකාරම් අයකර ගැනීම්	11,172,739	11,540,520
තැන්පතු ලැබීම්	298,114	171,725
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	202,628,282	190,495,956
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	180,863,304	172,725,263
සහනාධාර සහ මාරුකිරීම්	34,133	748,838
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,767,692	1,356,349
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	10,476,584	8,709,943
තැන්පතු ගෙවීම්	170,948	128,683
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	194,312,661	183,669,076
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	8,315,621	6,826,880
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වියදම්	8,315,621	6,826,880
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	8,315,621	6,826,880
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(8,315,621)	(6,826,880)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
[illegible]		

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	තතය 2024	2023	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		182,029,000	170,562,000	ඒසීඒ-3
-	තැන්පතු		298,114	171,725	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		11,007,181	11,161,719	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		193,334,295	181,895,444	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		193,334,295	181,895,444	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		193,334,295	181,895,444	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
127,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	117,459,357	116,770,995	
71,450,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	63,018,134	56,111,268	ඒසීඒ-2(ii)
1,050,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම	7	34,133	748,838	
-	පොළී ගෙවීම්	8	495,464	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
200,000,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		181,007,088	173,631,101	
	මූලධන වියදම්				
5,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	5,689,204	3,243,763	
1,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	1,142,819	537,246	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,000,000	හැකියා වර්ධනය	14	898,473	717,952	
30,000,000	වෙනත් මූලධන වියදම්	15	585,125	2,327,920	
37,000,000.00	මුළු මූලධන වියදම් (උ)		8,315,621	6,826,881	
	තැන්පතු ගෙවීම්		170,948	128,683	ඒසීඒ-4
15,000,000	අත්තිකාරම් ගෙවීම්		10,476,584	7,997,822	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		10,647,532	8,126,505	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		199,970,241	188,584,487	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(6,635,946)	(6,689,043)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(6,635,946)	(6,689,043)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3

ඒසීඒ-මී

2024 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	270,795,849	254,453,030
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	22,427,982	22,958,580
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**293,223,831**	**277,411,610**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		22,218,573	22,876,337
දේපළ පිරියත හා උපකරණ සංචිතය		270,795,849	254,453,030
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	209,409	82,243
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**293,223,831**	**277,411,610**

පිටු අංක 01 සිට.22 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..29..... සිට ..46..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :රංජිත් ආරියරත්න
තනතුර : ලේකම්
දිනය : 2025/02/26

රංජිත් ආරියරත්න
ලේකම්
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
2වන මහල, "සෙත්සිරිපාය" (අදියර II), බත්තරමුල්ල.

....
ගණන්දීමේ නිලධාරි
නම : ඩබ්.ටී.එච්.රුවිර විතාන
තනතුර :අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2/25

ඩබ්.ටී.එච්. රුවිර විතාන
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
5 වන මහල, 1 අදියර, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

....
අධ්‍යක්ෂ (මුදල්)
නම : ජී.පී.වයි.කුමාරි
දිනය : 25/2/2025

ජී.පී.වයි. කුමාරි
අධ්‍යක්ෂ (මුදල්)
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
5 වන මහල, "සී"
සෙත්සිරිපාය - බත්තරමුල්ල.

2

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන , රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුදල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	200,000,000.00	198,093,900.00	181,007,088.00	91%
ප්‍රාග්ධන	37,000,000.00	38,906,100.00	8,315,621.00	21%

3.5 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - නොමැත

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.6 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණ යට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	81,400,000.00	-	
9152	යන්ත්‍රෝපකරණ	-	106,855,449.23	-	
9153	ඉඩම්	-	82,150,000.00	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	390,400.00	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.7 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } HUD/E/2024/NPPD/FA/01   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2025 මැයි 28 දින

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 311- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

ශීර්ෂය 311- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	පාරිභෝජ්‍ය භාණ්ඩ ලෙස හඳුනාගතහැකි ඉතා අඩු වටිනාකමින් යුත් භාණ්ඩ,වසර ගණනාවක් තිස්සේ මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.	අංක 2/ 2019 හා 2019.06.04 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය මගින් 04/2018 චක්‍රලේඛය 03 හා 04 ඡේද ඉවත් කර ඇති බැවින් මූල්‍ය නොවන වත්කම් සඳහා සීමාවක් අදාල නොවේ
(ii)	2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අදාලව 2024 වර්ෂයේ මාර්තු මාසයේ දී අපරණය කරන ලද මූල්‍ය නොවන වත්කම් 2024 වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම් ලේඛනයෙන් ඉවත් කර නොමැති අතර එම වත්කම් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් තුල ඇතුලත්ව තිබිණි.	අපහරණය කල වත්කම්, මූල්‍ය නොවන වත්කම් ලේඛනයෙන් ඉවත් කල යුතුය.	2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අදාලව අපහරණය කරන ලද මූල්‍ය නොවන වත්කම් Cigas වැඩසටහනේ හඳුනා ගැනීමේ කටයුතු සිදුකරන අතර, ඉදිරියේ දී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

(ආ) අත්තිකාරම් ගිණුම් ශේෂ

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 4 වන වගන්තිය ප්‍රකාරව 2018 පසු විශ්‍රාම හෝ මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය මුදලක් අත්තිකාරම් බී ගිණුමෙහි නොදැක්වීමට ආයතන ප්‍රධානීන් වගබලාගත යුතු වුවත් දෙපාර්තමේන්තුවේ මියගිය සහ විශ්‍රාමික නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 352,311 අයකර නොගෙන අත්තිකාරම් බී ගිණුමෙහි දක්වා තිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය	2023 මැයි 31 දින මියගිය ආර්.ඒ.පී. ශ්‍රියානි මහත්මියගේත්, 2024 මාර්තු 02 දින මියගිය එන්.එල්.ඩී.එස්. කුමාර මහතාගේත් මරණ පාරිතෝෂිතය ගෙවීම සඳහා අදාල ලේඛන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර, මරණ පාරිතෝෂිතයෙන් නිලධාරීන්ට අයත් ණය ශේෂයන් අයකර ගත්විට අත්තිකාරම් 'බී' ගිණුමේ හිඟ ණය ශේෂයන් පියවීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත.

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	ස්ථාවර වත්කම් ලේඛනය		
	2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගැස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	සිගැස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම.	අපහරණය කලවත්කම් Cigas වැඩසටහනෙන් ඉවත් කළ පසු ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන වන අතර, ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.
(ii)	ඇප ලේඛනය		
	මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම.	මෙම දෙපාර්තමේන්තුවේ ඇප ආඥා පනතට හා මුදල් රෙගුලාසි 880 ට අනුව ඇප තැබිය යුතු සියලුම නිලධාරීන්ගෙන් ඇප තැන්පත් සිදු කිරීමට කටයුතු කරනු ලැබ ඇත.

2

(ඇ) ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	නිරීක්ෂණය	නිර්දේශය	දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම
(i)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදී ඇතත්, සමහර විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමේ දී මාස 1-3 ත් අතර කාලයක් ගත වී ඇත. ඉදිරියේ දී නියමිත කාල පරාසය තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට සටහන් කර ගතිමි.

(ඉ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි අංක 1645	-	පවත්වා ගතයුතු ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	ඉදිරිපත් කර ඇති කරුණු වලට අදාලව මේ දක්වා ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ. යාවත්කාලීන කර නොමැත්තේ කුමන ලොග් සටහන් පොතද යන්න නිවැරදිව සටහන් කර නොමැති බැවින්, අදාල කරුණට පැහැදිලිව පිළිතුරක් ලබාදිය නොහැක.
(ii)	භාණ්ඩාගාර චක්‍රලේඛ භාණ්ඩාගාර ලේකම්ගේ අංක		චක්‍රලේඛයට අනුව වත්කම හා පිරිවැය	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය.	01/2017 වත්කම් කළමනාකරණ

3

MF/CG/02/(iv) හා 2017 ජූනි 28 දිනැති නිකුත් කර ඇති 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය.	කළමණාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම යටතේ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යැවිය යුතු තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.	චක්‍රලේඛය අනුව, කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යැවිය යුතු තොරතුරු ඊ-මේල් මඟින් යවා ඇති අතර, වත්කම් කළමනාකරණය සම්බන්ධව වරින් වර ලැබී ඇති චක්‍රලේඛ අනුව, අදාල තොරතුරු ඊ-මේල් මඟින් යවා ඇත.

(ඊ) අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අනුමත නොකළ ගනුදෙනු

විධිමත් අනුමැතියකින් තොරව පහත සඳහන් ගනුදෙනු සිදු කර තිබුණි.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
මු.රෙ 137 අනුකූල නොවන පරිදි පූජා භූමි ශුද්ධ පවිත්‍ර කිරීම වෙනුවෙන් මුතියංගන කාර්යාලයේ නිලධාරීන් හට සතියේ වැඩකරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා කාලය වෙනුවෙන් අතිකාල ගෙවා තිබුණි. තවද, මෙම ව්‍යාපෘති කාර්යාල වල සේවය කරනු ලබන නිලධාරීන් විශ්‍රාම ගැන්වීමත් සමග තනතුර අහෝසි වන ලෙස බඳවා ගැනීම් සිදු කර ඇති අතර එවැනි තත්වයක් මත වැඩ බෙදා දී සතියට දින 05 ක් පමණක් වැඩ කරන ලෙස කාලසටහන් සකසා ඉතිරි දින දෙක සඳහා අතිකාල ලබා දීම පිළිබඳ පැහැදිලි අනුමැතියක් ඉදිරිපත් නොවූ අතර සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති කාර්යාල වෙත ගෙවූ අතිකාල ගෙවීම් වියදම දෙපාර්තමේන්තුවේ මුළු වියදමින් 79% ක් එනම් රු. 5,640,333 ක් වී තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි	නිවාඩු දිනවල සේවකයින්ට විශාල කාර්යභාරයක් සිදුකිරීමට ඇති නිසා එම දිනවල සේවකයින් අතිකාල සේවා ලෙස සේවය කිරීමට උනන්දුවක් නොදක්වයි. එම නිසා නිවාඩු දින අනිවාර්යය සේවා කොටසක් ලෙස පවත්වා ගත යුතුව ඇත. මේ නිසා සතිඅන්ත දිනවල අතිකාල ලෙස නොව, සාමාන්‍ය සේවාවන් ලෙස සේවා මුරයන් යටතේ පවත්වාගෙන යාම සිදුකර ඇත. මෙ සම්බන්ධව ඉදිරියේ දී කටයුතු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමැතිය ලබාදී ඇති අතර, සියළු විධිවිධාන ඇතුලත් කර අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇත.

4

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	පොළොන්නරුව පුලතිසිපුර නිවාඩු නිකේතනයේ නවාතැන් ගැනීම වෙනුවෙන් වසර 3 – 5 අතර කාලයක සිට ජනාධිපති කාර්යාලයෙන්, දෙපාර්තමේන්තුවට රු. 340,200 ක් අය විය යුතු වුවද එම මුදල අය කර ගෙන නොතිබුණි.	හිඟ මුදල් කඩිනමින් අයකරගැනීමට කටයුතු කල යුතුය.	ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වෙමින් අයකර ගත යුතු හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

2.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	මූලධන වැය විෂය අංක 311-1-1-1-2506 (ii) යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන්කල රු. 20,000,000 ක මුදලින් සියයට 99% ක්ම සංවර්ධනය කටයුතු සඳහා වැය නොකර වර්ෂය අවසානයේ ඉතිරි වී තිබුණි. නිසි සැලැස්මකට අනුව අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර නොගැනීම මෙම තත්වයට සෘජුවම හේතු වී තිබුණි.	නිසි සැලැස්මකට අනුව අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරගනිමින් අයවැය ප්‍රතිපාදන උපරිමයෙන් උපයෝජනය කල යුතු බව.	ලෝලුගස්වැව නැවත පදිංචි කිරීමේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය උපදේශකවරුන් තෝරා ගැනීම සඳහා මෙම ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ඒ සඳහා උපදේශක ආයතනයක් තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කල අතර 2024 වර්ෂය තුල මෙම කටයුතු නිම කිරීමට නොහැකි වූ බැවින් ප්‍රතිපාදන ඉතිරි විය
(ආ)	ආයතනය සතුව වාහන 14 ක් පවතින අතර වර්ෂය තුළ එම වාහන අළුත් වැඩියාව සඳහා රු.5,820,973 ක් වියදමක් මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණි. නමුත් මේ වන විට දෙපාර්තමේන්තුවේ කටයුතු කර ගැනීම සඳහා ධාවන තත්වයේ පවතින වාහන නොමැති අතර 2024 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් පිරිවැය වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන වල වාහන නඩත්තු පිරිවැය අතර රු1,252,217 ක හා ඉන්ධන පිරිවැය අතර රු.464,246 ක වෙනසක් නිරීක්ෂණය විය.	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් අදාල උපලේඛණ සමග සැසඳිය යුතුය.	ධාවන කටයුතු සඳහා සුදුසු තත්ත්වයේ පවතිනුයේ වාහන 09 ක් පමණක් වන අතර, ඉතිරි වාහන 05 ගර්හිත තත්ත්වයේ පවතී. එම වාහන 09 ම ඇතැම් අවස්ථාවන්හි අලුත්වැඩියා තත්ත්වයේ ද පවතිනු ඇත. 2024 වර්ෂය තුල මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වාහන අළුත්වැඩියා වියදම සහ ඉන්ධන වියදම නිවැරදි වේ. වාහන පිරිවැය වාර්තාව සකස් කිරීමේ දී 2023 වර්ෂයට අදාල වාහන අළුත්වැඩියා වියදම වන රු. 1,222,480/- ක මුදල 2024 වර්ෂයේ වියදම් කල ද, එය වාහන පිරිවැය වාර්තාවට

			ඇතුලත් වී නැත. ඉදිරියේ දී නිවැරදිව වාර්තාව සකස් කිරීමට උපදෙස් ලබාදෙන ලදී.
(ඇ)	දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වැය ෂීෂයන් 5 කට වෙනත් වැය විෂයන්ගෙන් රු. 4,156,100 ක් මාරු කරගෙන තිබූ අතර එය මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 17 ත් සියයට 100 ත් අතර ප්‍රතිශතයක් විය. වියදම් නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු නොකිරීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.	වියදම් නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කල යුතුයි.	ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් වී නොතිබූ වැය විෂයයන් 07 ක් සඳහා රු. 11,406,100.00 ක ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ මාරු කිරීම සිදුකර ඇත.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන බැදීම රු. 562,490 ක් වුවද සත්‍ය වශයෙන් හඳුනාගත් බැදීම රු. 785,427 ක් වි තිබුණි.	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් අදාල උපලේඛණ සමග සැසඳිය යුතුය.	2024 වර්ෂයට අදාල බැරකම් හා බැදීම් ලෙස Cigas වැඩසටහනේ ලබාගත්තා මුද්‍රිත පිටපත අනුව, රු. 209,719 ක් හා මු.රෙ. 94(2) ප්‍රකාර බැරකම් හා බැදීම් ලෙස 562,490 ක් ලෙස එකතුව රු. 772,209 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. එසේම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමෙන් පසු පෙබරවාරි හා මාර්තු (රු.13,218) මාසවල ඉදිරිපත් වූ වවුචර් වලට ගෙවීම් කර ඇති අතර, ඒ අනුව සත්‍ය වශයෙන් බැරකම් වටිනාකම රු.785,427 ක් වේ. තවද, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයට අනුව සිගාස් වඩසටහනට පසුගිය වර්ෂයට අදාල බැරකම් ඇතුලත් කිරීමට 2025 ජනවාරි 31 දක්වා කාලය ලබා දී තිබූ අතර, ඒ වනතෙක් ලැබී ඇති වවුචර් පමණක් සිගාස් වැඩසටහනට ඇතුලත් කර ඇත. පෙබරවාරි හා මාර්තු මාසවලදී ද පසුගිය වර්ෂයට අදාල ගෙවීම් කර ඇති නමුත්, **Cigas** වැඩසටහනට ඇතුලත් කිරීමට නොහැකි විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 දැක්ම හා මෙහෙවර

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියක් හා සැලැස්මක් සකස් කිරීම වුවත් වර්ෂ ගණනක් ගත වුවද එම කාර්ය ඉටු වී නොමැති අතර මෙම දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන අරමුණින් බැහැරව පූජා භූමි නඩත්තු කටයුතු හා පූජා භූමි ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කරමින් පැවතුණි. පූජා භූමි නඩත්තුව සඳහා සහ පූජා භූමි ලෙස ප්‍රකාශ කිරීම සඳහා විශාල පිරිවැයක් හා ශ්‍රමයක් දරනු ලබන අතර මානව සම්පත් ඌනතාවයක් දෙපාර්තමේන්තුවේ පවතින අවස්ථාවක ප්‍රධාන අරමුණින් බැහැර වෙනත් කාර්යන් වෙත සම්පත් යෙදවීමට කටයුතු කර තිබුණි.	ගැසට් මගින් දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යයන් ඉටුකිරීමට වගබලා ගත යුතුය.	2023 ජූනි 14 දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්තුමා හා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ පැවති සාකච්ඡාවේදී, 1. පූජාභූමි නඩත්තු කටයුතු හා පූජාභූමි ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමේ කාර්යය ඒ අයුරින්ම සිදුකරගෙන යෑමටත්, 2. දැනට පූජාභූමිවල සේවයේ නියුතු සේවකයන් විශ්‍රාම යාමෙන් පසු තනතුර අහෝසි වන පදනමින් කටයුතු කිරීම හා ඔවුන් විශ්‍රාම යාමෙන් අනතුරුව එම කාර්යයන් අදාල ආගමික ස්ථානයටම පැවරීමටත්, එම කාර්යයන් දෙපාර්තමේන්තුවේ කාර්යයක් සේ සලකා ඉටු කිරීමටත් තීරණය විය.

3.2 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබූ අතර එය 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ක්‍රියාකාරකම් වලින්ම සමන්විත වූ අතර බොහෝ අයිතමයන් වල දිනය පමණක් වෙනස් කර දක්වා තිබුණද ඒම අරමුණු බොහොමයක් පවා සමාලෝචිත වර්ෂය තුල ඉටු කර ගෙන නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ	ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම සඳහා සැලසුම් කල පරිදි අනුමැතිය ලබා ගැනීම නොහැකිවීම හා කාර්ය මණ්ඩල ප්‍රමාණවත් නොවීම වැනි කරුණු හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන අංගයන්ගේ ප්‍රමාදවීම සිදුවූ බැවින්, 2023 වසරේ ක්‍රියාකාරී සැලැස්මෙහි සමහර අංගයන් වෙනස් කර 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අඩංගු කිරීමට විය.

7

3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ (269 අධිකාරිය) හා 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනතේ 7 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තීන් සකස් කිරීම සහ ජාතික භෞතික සැලැස්ම පිළියෙල කිරිම 2021 ඔක්තෝබර් 31 වන විට අවසන් කලයුතු වුවත්, 2019 සකස් කර තිබූ ජාතික භෞතික සැලැස්ම අවශ්‍ය සංශෝධනක් සිදුකර ප්‍රකාශයට පත් කිරීම 2024 අගෝස්තු 31 වන විට සිදු කිරිමට සැලසුම් කර තිබූ නමුත් එම කටයුතු සැලසුම් කල පරිදි ඉටු වී නොතිබුණි.	පනත ප්‍රකාරව කටයුතු කල යුතුවේ	2020 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලය ලබාදෙනු ලැබූ උපදෙස් අනුව, 2019 වසරේ දී ගැසට් මගින් ප්‍රකාශයට පත්කරනු ලැබූ ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම සංශෝධනය කිරීම 2021 වර්ෂයේ ඔක්තෝම්බර් මස නිම කිරීමට සැලසුම් කරන ලදී. පනත ප්‍රකාරව 2023 වර්ෂයේ ජූනි මස 16 දින ජාතික භෞතික නිර්මාණ සභාව කොන්දේසි යටතේ අනුමැතිය ලබාදෙන ලදී. ඒසේ වුව(නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් පරිදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ප්‍රථම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු දැනුවත් කිරීමට සිදුවූ නිසා ඒ සඳහා කල්ගත විය.
(ආ)	අනුරාධපුර පූජා නගර භූමියේ ජනාවාස ව්‍යාප්තිය සීමා කිරිම හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා ලොල්ලුගස්වැව නගර නිර්මාණ ව්‍යාපෘතිය 2017 ආරම්භ කර 2024 දක්වා රු.මිලියන 1,053 ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, ඉන් රු.මිලියන 13.5 ක් එනම් සියයට 1 ක් පමණක් වැය කර තිබූ අතර ව්‍යාපෘති කාර්යාලය පමණක් ඉදි කර තිබුණි. මේ අනුව වසර 08 ක් ගත වුව ද අපේක්ෂිත අරමුණට ළඟා විමට නොහැකි වී තිබූ අතර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කිරිම සඳහා රාජ්‍ය ආයතන 04 කින් උපදේශකවරු බඳවා ගැනීමට තීරණය කර තිබූ නමුත් එම කටයුතු නිසි පරිදි සිදු නොවීම මත එම කාර්යය ද අසාර්ථක වී තිබුණි.	අයවැයෙන් වෙන්වන ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට වගබලාගත යුතුවේ.	මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ලෝලුගස්වැව නව නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහ(නැවත පදිංචි කිරීමේ ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම සඳහා උපදේශක ආයතනයක් තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර, 2025 මැයි 31 දින තෝරාගනු ලැබ ඇති උපදේශක ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කිරීමට සැලසුම් කර ඇත.

8

(ඇ)	2023 මෙන්ම 2024 වර්ෂය තුලදී මධ්‍යම, ඌව, නැගෙනහිර යන පලාත් 3 සඳහා ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද, 2024 වර්ෂය අවසාන වන විටත් කිසිදු සැලැස්මක වැඩ නිම කර නොතිබුණු අතර මධ්‍යම පලාතේ සංවේදී පරිසරයක් සඳහා උපදේශන මාලාවක් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද එයද සිදුකර නොතිබුණි. කළමනාකරණයේ දුර්වල අධීක්ෂණය මෙයට හේතු වී තිබූ අතර සැලසුමකින් තොරව නොගැලපෙන ඉදිකිරීම් සහ පොදු පහසුකම් විධිමත්ව නොමැතිවීම සහ පාරිසරික ගැටළු ඇති වීමට එය හේතු වී තිබුණි.	වර්ෂය තුලදී ඉටුකරගැනීමට සැලසුම් කල අයිතමයන් අදාල වර්ෂයේදීම ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	සැලසුම් කළ පරිදි ජාතික භෞතික සැලැස්ම නිම කිරීමේ කටයුතු නිම කිරීමට නොහැකි වූ බැවින්, ඌව පළාත් කලාපීය භෞතික සැලැස්ම සකස් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය. නැගෙනහිර හා මධ්‍යම පළාත් කලාපීය සැලසුම් කටයුතු මේ වනවිට අවසන් වෙමින් පවතින අතර, එම සැලසුම් කාර්මික උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කර නිර්දේශ ලබාගැනීම සඳහා සැලසුම් කර ඇත.
(ඈ)	පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා පූජා භූමි ලෙස සැලකෙන ප්‍රදේශයේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර අවශ්‍යයැයි සැලකෙන නිර්නායක සපුරා තිබේ නම් ගැසට් පත්‍රයක් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කෙරේ. සමාලෝචිත වර්ෂය තුල විහාර 104 ක් පූජා භූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට සහ සංවර්ධනය කිරීමට සහ සැලසුම් සකස් කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් වර්ෂය තුල දී එයින් විහාර 91 ක කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.	වර්ෂය තුලදී ඉටුකරගැනීමට සැලසුම් කල අයිතමයන් අදාල වර්ෂයේදීම ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	අදාල පියවරයන් අනුගමනය කිරීමේ දී ආගමික ස්ථානයක් ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමේ කාර්යය සඳහා වසරකට වඩා වැඩි කාලයක් ගතවේ.
(ඉ)	2023 වර්ෂයේ මෙන්ම 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ දක්වා ඇති 2024 වර්ෂයේ ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට යෝජිත පූජා භූමි අතර පහත නම් සඳහන් පූජා භූමි 2025 වසරේ ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට යෝජිත පූජා භූමි ලෙස තවදුරටත් නම් කර තිබුණි. • ශ්‍රී බෝධිරුක්ඛාරාමය විහාරය • වරකාගොඩ ගල්ලෙන් රජමහ විහාරය • වැවුරුකන්නල රජ මහා විහාරය • අතබැදි කදුරුකොටුවේ පුරාණ රජමහ විහාරය • වැලිපිට මෝදර ශ්‍රී ථූපාරාම රජමහා විහාරය	වර්ෂය තුලදී ඉටුකරගැනීමට සැලසුම් කල අයිතමයන් අදාල වර්ෂයේදීම ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	පූජාභූමි ගැසට් කිරීමේ කාර්යය පියවර කීපයකදී රාජ්‍ය ආයතන කීපයක් වෙතින් ඉටුවන බැවින්, ඒ සඳහා එක් වසර කිහිපයක් කාර්යසාධන වාර්තාවට ඇතුලත් කිරීමට සිදුවන අවස්ථා ඇත.

9

- බුද්ධියාගම සීගල රජමහා විහාරය

(ii) මීට අමතරව 2024 වර්ෂයේ ගැසට් කිරීමට යෝජිත ලෙස දක්වා තිබූ පහත සඳහන් පූජා භූමි 2024 වර්ෂයේද ගැසට් කර නොතිබූ අතරම ඉදිරියට ගෙන යාමක්වත් සිදු කර නොතිබුණි.

- හෙයියන්තුඩුව පුරාණ විහාරය - ත්‍රිකුණාමලය
- අස්ගිරිය පුරාණ රජමහා විහාරය

3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් අංක CGO/NFAMS/01/03 දරන 2024 මැයි 21 දිනැති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇමතූ ලිපිය අනුව 2024 අගෝස්තු 31 දිනට පෙර KG-9447,57-9387,GJ-4561, LB-8983 හා 65-0690 දරන වාහන අපහරණය කල යුතුව තිබුණද වර්ෂය අවසාන වන තෙක් එම වාහන අපහරණය කර නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය	අපහරණය කළයුතු වාහන පිළිබඳ තීරණයක් ගැනීමට කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු වාර්තාව අනුව වාහන අපහරණය සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය.
(ආ)	දෙපාර්තමේන්තුව විසින් වර්ග අඩි 15,054 ක් සඳහා වූ කාර්යාල ඉඩකඩ වෙනුවෙන් වාර්ෂිකව රු.39,328,876 ක කුලී ගෙවමින් පරිශ්‍රයක් පවත්වා කරනු ලබන අතර දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ නිලධාරීන් 30 දෙනෙකු බඳවා ගැනීම සඳහා 2018 වසරේ සිටම කාර්යාල පරිශ්‍රය පාවිෂන් කර ඊට අදාල කාර්යාල උපකරණ වෙන්කර තබා ගෙන තිබුණි. මෙම වත්කම් මෙන්ම ප්‍රධාන කාර්යාලයේ ද්විතියික හා විධායක මට්ටමේ නිලධාරීන් 71 දෙනෙකුගෙන් සමන්විත මුළු කාර්ය මණ්ඩලය 85 දෙනෙකුට අවශ්‍ය ප්‍රමාණයට වඩා කාර්යාල උපකරණ, පරිගණක උපාංග සහ මුළු පරිශ්‍රයෙන් 1/3 ක් පමණ වූ ඉඩකඩ ද ඌන උපයෝජිතව පවත්වා ගෙන ගොස් තිබුණි.	නිලධාරීන් බඳවාගැනීමට දිගුකාලයකට පෙර සිටම වත්කම් සම්පාදනය කර ඌන උපයෝජිතව තබා නොගත යුතුය.	භෞතික සැලසුම් සකස් කිරීමට සක්‍රීය දායකත්වයක් දක්වනු ලබන්නේ අනුමත කාර්ය මණ්ඩලය තුල ද්විතියික තාක්‍ෂණ හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් වේ. පවතින පුරප්පාඩු 142 අතුරින් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02, අධ්‍යක්ෂ තනතුරු 04, සහකාර අධ්‍යක්ෂ තනතුරු 12 ක් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී. සැලසුම් ශිල්පීන් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, රියදුරු හා කාර්යාල කාර්ය සහායක

10

			පවතින පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. අදාල පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් පසුව මෙම ගැටලුව නිරාකරණය වනු ඇත.
(ඈ)	දෙපාර්තමේන්තුව සතුව භාවිතයෙහි ඉඩම් 17 හා ගොඩනැගිලි 18 ක් පැවතියද තක්සේරු කර වටිනාකමක් හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගිණුම් ගත කර තිබුණේ ඉඩම් 8 හා ගොඩනැගිලි 11 ක් පමණි. මින් ඉඩම් 11 ක් සඳහා හිමිකම් ඔප්පු ලබා ගෙන නොතිබුණි.	නොපමාව ඔප්පු ලබාගැනීමට කටයුතු කල යුතුය.	ඉඩම්වල නිරවුල්භාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඉඩමේ සැලැස්ම/පිඹුර ලබාගත හැකිව ඇති බවත්, ඒ අනුව තක්සේරුව සිදුකල හැකි බවත්, ඉන් අනතුරුව ඊට සමගාමීව හිමිකම් ඔප්පුව ද ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ලබාගත හැක.
(ඇ)	මහියංගණයේ සංචාරක බංගලාව පවතින භූමියේ දෙපාර්තමේන්තුවට අයත් යැයි සැලකෙන එහෙත් දෙපාර්තමේන්තුව විසින් භාවිතයට නොගන්නා ඌනඋපයොජිත ගොඩනැගිල්ලක් පැවතුනි.	දෙපාර්තමේන්තුවට අයත් එහෙත් දෙපාර්තමේන්තුව විසින් භාවිතයට නොගන්නා වත්කම් උපයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය.	මෙම ගොඩනැගිල්ලේ බිම සකස් කිරීම සහ වැසිකිළි අළුත්වැඩියා කර යම් ප්‍රමාණයක ඌණ උපයෝජනය අවසන් කර, සංචාරක බංගලාවක් ලෙස කණ්ඩායම් වලට ලබා දීමට මෙම වසරේ සිදු කිරීමට බලාපොරොත්තු වේ. ඉදිරි වසරේ දී අනෙකුත් අළුත්වැඩියා කටයුතු කිරීමට නියමිතය.
(ඉ)	දෙපාර්තමේන්තුව භාවිතයේ පවතින අංක 65-0690 දරන වාහනය මුදල් අමාත්‍යාංශයට අයත් වාහනයක් වන අතර එම වාහනය මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	වත්කම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමටත් නිවැරදි ආකාරයට ගිණුම්වල පෙන්වීමටත් කටයුත් කල යුතුය.	65-0690 දරණ වාහනය මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

	විගණන විමසුම පිළිබඳ විස්තරය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	සමාලෝචිත වර්ෂයේ විගනණයට අනුකූලව නිකුත් කරන ලද විගණන විමසුම් සඳහා දෙපාර්තමෙන්තුව විසින් නියමිත කාල පරාසය තුළ පිළිතුරු ලබා දී නොතිබුණු අතර ඒවාට පිළිතුරු	විගණන විමසුම්වලට නියමිත කාලය තුලදී පිළිතුරු ලබාදිය යුතුය.	දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති සියළුම විගණන විමසුම සඳහා පිළිතුරු ලබාදී ඇතත්, සමහර විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමේ දී මාස 1-3

11

ලබා ගැනීමට මාස 1-3 අතර කාලයක් ගතවී පැවතුණි.		ත් අතර කාලයක් ගත වී ඇත. ඉදිරියේ දී නියමිත කාල පරාසය තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට සටහන් කර ගතිමි.

4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 02/2017 චක්‍රලේඛය ප්‍රකාරව නිමැවුම් දර්ශක හඳුනා ගැනීම, ප්‍රධාන කාර්ය දර්ශකය ප්‍රකාශයට පත් කිරීම, ආයතනයේ කාර්යභාරය හා සබැඳි පාර්ශව හඳුනා ගැනීම යන තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධීකරණය කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ.	ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අදාළ තිරසාර සංවර්ධන අරමුණු හා තිරසර නිමැවුම් දර්ශක හඳුනාගෙන ඇති අතර එම අරමුණු සබැඳි සමහර පාර්ශව හඳුනාගෙන දැනුවත් කිරීම කර ඇති අතර සමහර සබැඳි පාර්ශව හඳුනා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතියි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	දෙපාර්තමේන්තුව විසින් ජාතික භෞතික සැලැස්ම පිලියෙළ කිරීම සහ ඊට අවශ්‍ය සංශෝධනයන් කාලීනව සිදුකළ යුතු අතර මේ සඳහා රටේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් සහ ප්‍රමාණවත් සැලසුම් ශිල්පීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය. නමුත් දෙපාර්තමේන්තුවේ එම තනතුරු සඳහා විශේෂඥ දැනුම ඇති නිලධාරීන් ප්‍රමාණවත් පරිදි නොමැති අතර ජාතික භෞතික සැලසුම් ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අනිකුත් රාජ්‍ය ආයතන වල විශේෂඥ දායකත්වය ලබාගත හැකි වන පරිදි 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත 2000 අංක 49 දරන නගර නිර්මාණ පනත මගින් සංශෝධනය කර තිබූ නමුත්	විශේෂඥ දැනුම ඇති නිලධාරීන් ප්‍රමාණවත් පරිදි බඳවාගෙන ජාතික භෞතික සැලසුම් ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය.	2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ පනත අනුව, රටේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන විද්වතුන්ගෙන් සැදුම්ලත් කාර්මික උපදේශක කමිටුවක් පිහිටුවිය යුතු අතර, ඒ අනුව විටින් විට එම කමිටු පිහිටුවා අවශ්‍ය උපදෙස් ලබාගෙන ඇත. 2021 වර්ෂයේ දී පත්කරනු ලැබූ කාර්මික උපදේශක කමිටුවේ කාලය වසර තුනකින් නිමවීමෙන් අනතුරුව අළුතින් එම කමිටුව මේ වනවිටත් පත්කර ඇත.මීට අමතරව දෙපාර්තමේන්තුවට අදාල විධායක ශ්‍රේණි තනතුරු බඳවා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර ඉන් සහකාර අධ්‍යක්ෂ තනතුරු 12

12

	දෙපාර්තමේන්තුව ස්ථාපිත කර වසර 11 කට වැඩි කාලයක් ගත වී තිබුණත් ජාතික භෞතික සැලසුම් ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී තිබුණි.		ක් බඳවා ගැනීමේ කටයුතු අවසන් අදියරේ පවතී.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 287 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 145 ක් වූයෙන් පුරප්පාඩු 142 ක් විය. මෙය නියමිත කාලවකවානුව තුළ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතුව තිබූ භෞතික සැලසුම් සකස් කිරීමට නොහැකි වීමට සෘජුව බලපා තිබුණි.	පුරප්පාඩු පුරවා නියමිත කාලවකවානුව තුළ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතුව තිබූ භෞතික සැලසුම් සකස් කිරීමට කටයුතු කල යුතු ය.	භෞතික සැලසුම් සකස් කිරීම සඳහා සෘජුවම දායකත්වය ලබාදෙන තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී. සැලසුම් ශිල්පීන් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. ඊට අමතරව පුරප්පාඩුව පවතින අනෙකුත් නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.
(ඇ)	රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 18/2001 හා 2001 අගෝස්තු 22 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව දීප ව්‍යාප්ත සේවාවල සේවය කරනු ලබන නිලධාරීන් වර්ෂය 05 න් 05 ට ස්ථාන මාරුවීම සිදුකල යුතු වුවද වසර 05ට වැඩි මෙන්ම වසර 20 ඉක්ම වූ නිලධාරීන්ද ස්ථාන මාරු නොලැබ දෙපාර්තමේන්තුවේ තවදුරටත් සේවය කරමින් පැවතුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ.	දැනට මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්තව දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් 07 ක් සේවය කරන අතර, ඉන් මෙම දෙපාර්තමේන්තුව තුල අවුරුදු 05 ට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන් 05 ක් සිටින අතර, නිලධාරීන් දෙදෙනෙකු පමණක් අවුරුදු 09 ක් හා 08 ක් සේවය කරමින් පවතී.

එස්. සංජීව
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුවේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
1. යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලැස්ම සහ ප්‍රතිපත්තිය	√		
2. සකස් කරන ලද කලාපීය සැලසුම්			√
3.ප්‍රාදේශීය සහා සීමාවන්හි පිහිටි නාගරික ප්‍රදේශ හඳුනාගැනීම	√		
4. ගැසට් කරන ලද පූජාභූමි			√
5. පූජා භූමි සඳහා සකස් කරන ලද වින්‍යාස සැලසුම්			√
6.පූජා භූමි සඳහා තාක්ෂණික උපදේශනය ලබාදීම	√		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
		0% -49%	50%- 74%	75% - 100%
2030 වන විට, සියලු රටවල සහභාගීත්ව, ඒකාබද්ධ සහ තිරසාර මානව ජනාවාස සැලසුම් කිරීම සහ කළමනාකරණය සඳහා අන්තර්ගත සහ තිරසාර නාගරීකරණය සහ ධාරිතාව වැඩි දියුණු කිරීම	ජනගහන වර්ධන අනුපාතයට ඉඩම් පරිභෝජන අනුපාතය	√		
ජාතික හා කලාපීය සංවර්ධන සැලසුම්කරණය ශක්තිමත් කිරීම මගින් නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර ආර්ථික, සමාජයීය හා පාරිසරික අංශයන්හි සම්බන්ධතාවන් සඳහා සහාය වීම	කලාපීය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සකස් කරනු ලැබ ඇති සැලසුම් ගණන	√		

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් සකස් කරන ලද තිරසරපරමාර්ථ අතරින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අදාළ වන පරමාර්ථය වන්නේ 11 වන පරමාර්ථය වන අංග සම්පූර්ණ ආරක්ෂක, ශක්තිමත් සහ තිරසාර නගර ඇතිකිරීම. එම අරමුණ ළඟා කර ගැනීම සඳහා ඉහත සඳහන් ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන ඇත. එම ඉලක්කවලට ළඟා වීම සඳහා කලාපීය සහ ප්‍රාදේශීය සැලසුම් සකස් කළ යුතුව ඇත.මෙම වාර්තාවේ 2 පරිච්ඡේදයේ 2024 වසරේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට පැවති අභියෝග යටතේ දක්වා ඇති පරිදි ප්‍රධානතම අභියෝගය වූයේ සැලසුම්කරණයට අදාලව පවතින තනතුරු පුරප්පාඩුව පැවතීමය.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	51	12	38
තෘතීයික	08	02	05
ද්විතීයික	115	49	59
ප්‍රාථමික	113	82	24
එකතුව	287	145	126

06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික හා ජ්‍යෙෂ්ඨ යන සියළු මට්ටම් සැලකූවිට දැනට සිටින්නේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 50% කට ආසන්න සංඛ්‍යාවකි. 2024 වර්ෂය සඳහා සාදන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව කලාපීය භෞතික සැලසුම් 02 ක වැඩ නිම කිරීමට බලාපොරොත්තු වුවද, මානව සම්පත් හිඟකම නිසා එම අරමුණු ඉටුකර ගැනීමට නොහැකි විය.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)දේශීය	වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
නිවාඩුභාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම	01	දිනකි	5000.00	දේශීය	කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය දැනුම ලබා ගැනීම
පුද්ගලික ලිපි ගොනුවක් පවත්වා ගෙන යාම	03	දෙදිනකි	39,000.00	දේශීය	
අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලන ක්‍රම	01	දෙදිනකි	13,000.00	දේශීය	
වාහන කළමනාකරණය	02	දිනකි	27,000.00	දේශීය	
වැටුප් පරිවර්තන පුහුණු වැඩමුළුව	04	දිනකි	12,000.00	දේශීය	
Government payroll system	02	තෙදිනකි	42,000.00	දේශීය	
Workship on public procurement procedures	01	දෙදිනකි	13,000.00	දේශීය	
පරිපාලන නිලධාරී ධාරිතා සංවර්ධනය	01	තෙදිනකි	15,000.00	දේශීය	
විගණන කටයුතු පිළිබඳව	සියලුම නිලධාරින්	එක් දින	34,150.00	දේශීය	
ගිණුම්කරණ ක්‍රමවේදය	01	එක් දින	13,000.00	දේශීය	

සහ ගිණුම් පිළියෙල කිරීම					
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	04	එක් දින	20,000.00	දේශීය	
රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් B ගිණුම පිළියෙල කිරීම	01	එක් දින	7000.00	දේශීය	
කාර්යාල කාර්ය සහායකයින්ගේ කාර්යභාර්යය හා වගකීම	01	දෙදිනකි	13,000.00	දේශීය	
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	02	එක් දින	50,000.00	දේශීය	
Government payroll system	02	තෙදිනකි	42,000.00	දේශීය	
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් අපහරණය	01	දෙදිනකි	13,000.00	දේශීය	
පුද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව	01	දෙදිනකි	13,000.00	දේශීය	
Training at Moratu uni	සැලසුම් ශිල්පීන්	මාසයකි	480,000.00	දේශීය	
ආකල්ප සංවර්ධනය හා ධනාත්මක චින්තනය	සියලුම නිලධාරීන්	දිනකි	55,000.00	දේශීය	

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ	අනුකූල වේ		
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්			
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**	අනුකූල වේ		
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල	අනුකූල වේ		

	පවරා දී තිබීම			
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/12019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ	අනුකූල වේ		

	කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම			
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		භාණ්ඩ සමීක්ෂණය අවසන් කර ඇත.ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.3/31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නියමිතය
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ		අපහරණ කටයුතු සිදුකරමින් පවතී.
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	කමිටු පත්කර අදාල කටයුතු සිදුකරමින් පවතී	ඉදිරියේදී එම කටයුතු අවසන් කල හැක
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1	අනුකූල වේ		ධාවන තත්ත්වයේ පවතින වාහන සඳහා

	ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.			ඉන්ධන පරීක්ෂා සිදු කර ඇත
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු	අනුකූල වේ		

	අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම	අනුකූල වේ		
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම	අනුකූල වේ		
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		